සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
2011.03.04 දින පළ වූ අංක 1696 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.
2011.02.25 දින අංක 1695 දරන ගැසට් පත්‍රයේ VI කොටසේ 2011 වර්ෂය සඳහා කොළඹ මහාධිකරණයේ ජූරි සභිකයින්ගේ නාමාවලියක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,697 - 2011 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2011.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 780 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 780 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මාර්තු මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 මාර්තු මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් පාලන නිවේදන

**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය හා 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ තිරප්පනේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2010 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. අයි. රත්නායක,
සභාපති,
තිරප්පනේ ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 15 වැනි දින,
තිරප්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර, තිරප්පනේ ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද සෑම ප්‍රදේශයකම පිහිටි සෑම නිශ්චල දේපළක 2010 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2011 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගත යුතු යැයි යෝජනා කරමි.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය සහ VI වැනි උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර, තිරප්පනේ ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකමින් 6%ක අනු ප්‍රමාණය අනුව වූ වටිනාකමක් 2011 වර්ෂය සඳහා පනවා අයකර ගත යුතු යැයි ද වාර්ෂික, වරිපනම් බදු මුදල 2011 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික (04) හතරකින් ගෙවීමට විධානකළ යුතු යැයි ද යෝජනා කරමි.

03-168/3

---

# විවිධ දැන්වීම්

**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

වාහන හා සත්ත්ව බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ තිරප්පනේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් සහ සතෙක් වෙනුවෙන්ම මෙහි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2011 වර්ෂයේ දී පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

**උපලේඛනය**

| | රු. ශ. |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්,මෝටර් බයිසිකලයක් කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| (අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 0 |
| සෑම අත්කරත්තයක් සඳහා | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| සෑම අශ්වයෙකු පෝනියෙකු කොටළුවෙකු සඳහා | 15 0 |
| සෑම ඇතෙකු සඳහා | 50 0 |

03-168/6

**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂයට කසල බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108, 109 වගන්ති යටතේ, ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල, ප්‍රකාර 2010 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. අයි. රත්නායක,
සභාපති,
තිරප්පනේ ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 15 වැනි දින,
තිරප්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108, 109 වගන්ති යටතේ,ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, පහත දැක්වෙන නගරවලින් කසල ශෝධන සේවයේ ප්‍රයෝජන ලබන නේවාසික ස්ථානවලින් හා වාණිජ ස්ථාන වලින් 2011 වසර සඳහා පහත සඳහන් වාර්ෂික කසල ශෝධන ගාස්තුවක් පනවා අය කිරීම සුදුසු යැයි යෝජනා කරමි :

| | | රු. ශත |
|---|---|---|
| 01. | නේවාසික ස්ථානවලින් වසරකට | 400 0 |
| 02. | වාණිජ ස්ථානවලින් වසරකට | 600 0 |

03-168/1

---

**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂයට ව්‍යාපාර බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ තිරප්පනේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2010 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. අයි. රත්නායක,
සභාපති,
තිරප්පනේ ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 15 වැනි දින,
තිරප්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ තිරප්පනේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් තිරප්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2011 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2010 වර්ෂයේ ආදායම මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි (II) වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණය අනුව බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

***උපලේඛනය***

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| *2008 වර්ෂයේ දී ව්‍යාපාර ආදායම* | *රු. ශත* |
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| රු. 6,000 ඉක්මවන එහෙත් රු 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| රු. 75,000 ඉක්මවන එහෙත් රු . 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1200 0 |
| රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

03-168/4

## තිරප්පනේ ප්‍රාදේශීය සභාව

2011 වර්ෂයට කර්මාන්ත බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ තිරප්පනේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2010 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. අයි. රත්නායක,
සභාපති,
තිරප්පනේ ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 15 වැනි දින,
තිරප්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර තිරප්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් මෙම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයේ බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

**උපලේඛනය**

| *1 වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය* | *II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ටයර් ,ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| මෝටර් වාහන පමණක් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| බැටරි චාජ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| පින්තාරු තීන්ත, වාර්නිෂ්, ඩිස්ටෙම්පර් හෝ සායම් වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ජී අයි තහඩුවලින් උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ බෙහෙත් ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| වී කෙටීමේ හා ධාන්‍ය ඇඹරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| විකිණීම සඳහා පැණි නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| දියහුණු (වෛනිත ) හුණු හෝ හිරිගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| යන්ත්‍රානුසාරයෙන් සහල් ඇඹරීමේ හා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| උළු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගඩොල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ටින්කර් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කෘෂි බීජ නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| මැටිභාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |

03-168/5

**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය යටතේ තිරප්පනේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2010 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. අයි. රත්නායක,
සභාපති,
තිරප්පනේ ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 15 වැනි දින,
තිරප්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ පනතේ විධිවිධාන යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා තිරප්පනේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ දී නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් මෙම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කල යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

| *1 වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|
| *බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| හෝටලයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| බත් කඩයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| ආපන ශාලාවක් පැවැත්වීම | 600 0 | 750 0 | 1,000 0 |
| තේ කඩයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| කෝපි කඩයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| බේකරියක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| කිරි විකිණීම | 600 0 | 750 0 | 1,000 0 |
| මාළු විකිණීම | 600 0 | 750 0 | 1,000 0 |
| මස් විකිණීම | 600 0 | 750 0 | 1,000 0 |
| අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| ගව ගාලක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| පෞද්ගලික වෙළඳපොලක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| කොණ්ඩ සැකසීමේ සැලුන් හලක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |

එසේ වුව ද යම් පරිශ්‍රයක හෝටලයක, ආපනශාලාවක හෝ නවාතැන් පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද අනුමත කර හෝ පිළිගත්තා වූ ද, අවස්ථාවක බලපාන ගාස්තු 2010 වර්ෂයේ ඒ හෝටලයේ, ආපන ශාලාවේ, නවාතැන් පොළෙහි ආදායමෙන් 1%ක් විය යුතු ය.

03-168/2

F 2 - B 80206 (S/E) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.